Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 4

විෂය:- නර්තනය


ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# නර්තන කලාවේ නූතන ප්‍රවනතා



රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ පැමිණීමත් සමඟ නර්තන කලාවේ නව ප්‍රබෝධයක් ඇති වීමට පසුබිම සකස් විය



# නර්තන කලාවේ නූතන ප්‍රවණතා

- අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවනතා
- සමාජ අවශ්‍යතා හා ආකල්ප මත ඇති වූ නව ප්‍රවනතා
- ප්‍රසංගික කලාවක් ලෙස ඇති වූ නව ප්‍රවනතා
- නව තාක්ෂණික ක්‍රමෝපායයන් පදනම් කරගෙන ඇති වූ නව ප්‍රවනතා
- විවිධ සංස්කෘතීන්ගේ බලපෑම හේතුකොටගෙන ඇති වූ නව ප්‍රවනතා

## අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවනතා

❖ 1936 ගාන්ධර්ව සභාව ආරම්භ කොට ගාන්ධර්ව විභාගය ආරම්භ කිරීම

❖ 1943 ප්‍රථමයෙන් පාසල්වල නර්තන විෂයය ඉගැන්වීම ආරම්භ වීම.

❖ 1952 රජයේ ලලිත කලායතනය ආරම්භ කිරීම

❖ 1956 සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමෙන් පසු කලායතන බිහිවීම

❖ 1972 රජයේ පාසල්වලට සෞන්දර්ය විෂයය අනිවාර්ය වීම සහ එම වර්ෂයේදී ම සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාල ආරම්භ කිරීම

❖ 1952 ආරම්භ කළ රජයේ ලලිත කලායතනය උසස් අධ්‍යාපනය සඳහා 1974 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය අනුබද්ධකොට සෞන්දර්ය අධ්‍යායන ආයතනය ආරම්භ කිරීම

❖ 1978 වර්ෂයේදී අ.පො.ස.උ.පෙළ විෂයය ධාරාවට නර්තනය විෂයයක් වශයෙන් ඇතුළත් කිරීම

❖ 1986 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ආයතනය යටතේ සෞන්දර්ය දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් විෂයය නිර්දේශ,ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම හා ආරම්භ කිරීම

❖ අධ්‍යාපනික වශයෙන් සංවර්ධනය වීමේදී ගුරුකුල හා ගුරු ගෙදරට සීමා වී තිබූ නර්තනය ව්‍යවහාරික බවට පත්වීමෙන් විභාග අරමුණු කරගත් තරඟකාරී බවක් විෂයය තුළ ඇතිවීම


❖ නර්තන කලාව හා බැදි විචාර කලාවක් බිහිවීම


❖ පාසල් අතර වසරින් වසර සමස්ත ලංකා නර්තන තරග පැවැත්වීමෙන් ගුරු හා සිසු ශක්‍යතා ඔප් නැංවීමට හැකිවීම


**කැලණිය විශ්වවිද්‍යාලීය අනුබද්ධ සෞන්දර්ය අධ්‍යයන ආයතනය 2005 වර්ෂයේද දී සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නමින් ස්වාධීන,පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම**




පර්යේෂණ මගින් නර්තනය සම්බන්ධ විවිධ කෘති රචනා වීම







නර්තන විෂයය සඳහා ආචාර්යයවරුන්,මහාචාර්යවරුන් බිහිවීම හා උසස් අධ්‍යාපනය සඳහා විදෙස් ගත වීමට අවස්ථා උදාවීම



මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා



මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා




මහාචාර්ය ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය



ආචාර්ය අශෝකා දිසානායක මහත්මිය

# සමාජ අවශ්‍යතා හා ආකල්ප මත නර්තනයේ ඇති වූ නව ප්‍රවණතා

විවිධ ආයතන හා නර්තන කණ්ඩායම් බිහිවීම




විවධ උත්සව සඳහා නර්තන යොදා ගැනිම

- මංගල උත්සව
- පිළිගැනීමේ උත්සව
- සමාරම්භක උත්සව
- පෙරහැර
- සංදර්ශන









# කාන්තාවන් ශීඝ්‍ර ලෙස නර්තන කලාවට යොමුවීම





**අභ්‍යාසය**

01.නර්තන කලාවේ ඇති වූ නව ප්‍රබෝධය නිසා සිදු වූ නව ප්‍රවනතා 03 ක් ලියන්න.

02.අධ්‍යාපනික ප්‍රබෝධය මත බිහි වූ මහාචාර්යවරුන් තිදෙනෙක් නම් කරන්න.

03.එම මහාචාර්යවරුන් විසින් ලියන ලද නර්තනය සම්බන්ධ පර්යේෂණ කෘති 03 ක් නම් කරන්න.

04.සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් වූයේ කිනම් වර්ෂයේදී ද?

05.රජයේ පාසල්වලට සෞන්දර්ය විෂයය අනිවාර්ය කරන ලද්දේ කුමන වර්ෂයේ ද?